කෙටුම්පත

චක්‍රලේඛ අංක: 1993/25

මගේ අංකය: 3/පාසං/ප්‍රාඅ/11
පාසල් සංවර්ධන හා කළමනාකරණ අංශය,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
'ඉසුරුපාය'
බත්තරමුල්ල.

1993 නොවැම්බර් ... දින

සියලුම
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ය.

## දෙවන වසර නව විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම - 1994

ජාතික අධ්‍යාපන ආයතනය මඟින් සකස් කරන ලද දෙවන වසර සඳහා වූ නව විෂය නිර්දේශ 1994 ජනවාරි මස සිට දිවයිනේ සියලු පාසල්වල (සිංහල හා දෙමළ මාධ්‍ය) ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශය විසින් අනුමත කර ඇත.

එම නව විෂය නිර්දේශ භාවිතය පිළිබඳ 2 වසර ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා පළාත් මට්ටමින් ගුරු උපදේශකවරුන් පුහුණු කිරීම දෙසැම්බර් පළමු සතිය වන විට අවසන් කරන බවත් නව විෂය නිර්දේශයේ මුද්‍රිත පිටපත් ජනවාරි මුල දී පාසල් අතර බෙදා දීමට සැලසුම් කර ඇති බවත් ජාතික අධ්‍යාපන ආයතනය දන්වා සිටියි.

කරුණාකර ඔබ පළාතේ/ කොට්ඨාශයේ සියලු පාසල්වල නව විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා දෙවන වසර ගුරුවරුන් පුහුණු කරවීමට ඉක්මන් පියවර ගන්න. ඒ අරමුණින් ජාතික අධ්‍යාපන ආයතනය විසින් පුහුණු කරන ලද උපදේශකවරුන්ගේ සහාය ලබා ගත යුතුය. මේ කාර්යය 1994 පළමු වාරය ආරම්භ කිරීමට පෙර කළ යුතු බව කරුණාවෙන් සලකන්න.

දෙවන වාර සිසුන් සඳහා අධ්‍යයන අධ්‍යාපන ක්‍රියාවලියේ දී ඒ ඒ විෂය ක්ෂේත්‍ර හා කාර්ය වෙනුවෙන් සතියකට වෙන් කළ යුතු කාලය පිළිබඳ යෝජනා මතු දැක් වේ. විෂය සමෝධානය කර ඉගැන්වීම සඳහා නම්‍ය ලෙස කාලය හසුරුවා ගෙන දවසේ ඉගැන්වීමේ කටයුතු සැලසුම් කර ගත යුතුය.

| විෂය ක්ෂේත්‍රය/ කාර්යයන් | සතියකට පැය | කාලය මිනිත්තු |
|---|---|---|
| 1. උදය රැස්වීම, ආගමික වතාවත් හා යහජීවන පුරුදු | 1 | 15 |
| 2. ශාරීරික අධ්‍යාපනය | 1 | 15 |
| 3. භාෂා වර්ධනය | 4 | 35 |
| 4. ගණිතය | 4 | 35 |
| 5. අප හා පරිසරය | 2 | 30 |
| 6. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 1 | 50 |

| | | |
|---|---|---|
| 7. සෞන්දර්ය ක්‍රියාකාරකම් | 1 | 30 |
| 8. ආගම | 1 | 15 |
| 9. නාම ලේඛනය පියවීම හා විවේකය | 1 | 15 |
| | 20 | 00 |

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

පිටපත්:

1. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
2. විභාග කොමසාරිස්
3. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්
4. අධ්‍යාපන පීඨ කොමසාරිස් දැන ගැනීම සඳහා
5. අධ්‍යාපන අධ්‍යක්ෂ, ගුරු විද්‍යාල

(දැන ගැනීම සඳහා)